Page 8 September 2008 .qxd 18/09/2008 20:41 Page 1



## කවි කොළය

# මෙගා MEGA TV

සමහරු වඳිද්දී යුග අත් සිරස නගා
බැණ අඬගසති ඇතැමෙක් ටෙලි වලට **මෙගා**
මින් බහුතරය - කළ මිනිසත් බවට නිගා
කුණුකන්දල්ය දෙන මී පැණි සමග පොඟා

පවුලේ කතාවක් මුලදී පටන් ගෙන
අල්ලපු ගෙදරටත් රිංගා වැටෙන් පැන
අතු ඉති කතා එක්කරමින් ඇදෙන් යන
මේවා මළකුණුය මේ අය වවන් කන

කලුවේ කොලඹ ගොස් පොල්ගස් බඩ ගාන
ගොඩ මඩ ඉඩම් අරගෙන වාහන යාන
මහ පොහොසතෙකු වන තුරු අවුරුදු ගාණ
බට්ටිගෙ බඩේ පැටියා ඇත බිහි නූණ

අවුරුදු ගණන් බඩවැල මෙන් දිගට ඇදේ
අග මුල පරස්පර අදහස් එකට යෙදේ
පිට ඇති ලෙල්ල මිස ඇතුළත නොමැත මදේ
මෙය වාතයකි වැසිකිළියෙදි ඇසෙන උදේ

අදියුරු තැනට නලුවෙකු වූ විටදි එපා
අලවයි ඔහුට වෙන කෙනෙකුගෙ මුහුණ කපා
සිනමා පුවත් පත් හඳුනන වෙළඳ උපා
නමදින අයුරු දකිතැක මේ අයගෙ දෙපා

තවරා රෝස සායම මේකප් නානු
පෙන්වයි අපට තක්කලි ගෙඩි වැනි මූණු
මේ කුණු රසට උතුරණ පල්ලෙහි කානු
පොරකති වහවැටී මොළයක් නැති ගෑණු

නලු නිළියන් පවා ඉහළම සිගිති තිරේ
ටෙලිවල **මෙගා** මැටි රූකඩ බවට හැරේ
වැඩ පළ පවා අමතක කොට ගෙදර දොරේ
පවුලම එකට නරඹයි ***මහගෙදර*** පොරේ

එක් කෙල්ලකගෙ පෙම් කෙළියට අවිනීත
වලිකන පවුල් තනු හතරක් බහුබූත
***මුතු*** යයි කියා පෙන්වන මේ වැනි වාත
පිස්සන් කොටුවෙ වත් නැත මේ ළඟ පාත

අම්මා තාත්තා දූවරු
සමග පුතු
උනුනුන් මරා ගන්නා
වයිරයම පැතු
මේ වල්බූත කුණු
කන්දල් එකට එතු
නරඹන අපට මඩු
වලිගෙන් තැලිය යුතු



♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**



# බැරිද ටෙලියකට සල්ලි දාන්න?

**මේ** ළඟදී ලංකාවට ගිය අපේ සිංහළ මිතුරෙකු කොළඹ පැවති සාදයකට සහභාගි වූයේය. ඔහු බ්‍රිතාන්‍යයේ නෝර්ත් සී ඛනිජ තෙල් සමාගමට සම්බන්ධ ඉන්ජිනේරුවෙකි. සාදයේදී තවත් මිතුරෙකු ඔහු තවත් තරුණයෙකුට හඳුන්වා දෙමින් එංගලන්තයේ පදිංචි ඉන්ජිනේරුවෙකු බව ද කීවේය. "එහෙ නම් සැහෙන ධනවතෙක් වෙන්න ඇති නේද? " අර අළුතින් හඳුන්වා දුන් හාදයා ඇසීය. අප මිතුරා කළේ කිසිවක් නොකියා සිනාසීම පමණි. ඊළඟට ඒ තැනැත්තා ඇසූ ප්‍රශ්නය මෙසේය. "බැරි ද ටෙලියකට සල්ලි දාන්න? මං ටෙලියක් කරන්නයි හිතං ඉන්නෙ."

"මොකක්ද ඒ ටෙලියක් කිව්වෙ?" අපේ හිතවතා ඇසී ය.

"ඇයි දන්නෙ නැද්ද? ටෙලියක් කිව්වෙ ටෙලි නාට්‍යයක්. "

අපේ මිතුරා කළේ සිනා සී හිස දෙපැත්තට වැනීම ය. ටෙලි මැන් එහෙම්ම මාරුවී ගියේ ය.

ටෙලියක් ලෙසින් ලංකාවේ හඳුන්වන රූපවාහිනියේ නාට්‍ය දැන් ඒ රටේ පිස්සුවකි. එසේ ම විනෝදාස්වාදයට වඩා නරඹන්නන්ගේ කාලය හා බුද්ධිය පැහැර ගන්නා බිස්නස් එකකි. **BBC** හි **කොරනේෂන් ස්ට්‍රීට්** හා **ඊස්ට් එන්ඩර්ස්** වගේ ලංකාවේ ඇතැම් නාට්‍ය දිගටම දුවන්නට සළස්වා ගැනීම සඳහා එහි නිශ්පාදකවරු කතාව දිග්ගස්සති. පැය බාගෙක කතාංගයක (episode) දැන්වීම් ගණන ඉවත්කළ විට කතාව විනාඩි දහයක් වත් නැත. නාලිකා ගණනාවකම තරඟයට මහා හෙවත් **මෙගා ටෙලිනාට්‍ය** පෙන්වති. ඇතැම් කතා දිගටම මාස ගණන් පෙන්වන විට කතා රචකයාටම කතාවේ මුල සිද්ධීන් මතක නැත. එක් එවැනි ටෙලි නාට්‍යයක වූ කතාවේ සිදුවීමක් මෙසේ ය.

එක් ගමක අළුත විවාහ වූ තරුණ කාන්තාවක් කුළුඳුලේ දරු-වෙකු ලැබීමට ගර්භණීව සිටී. ඇගේ සැමියා රැකියාවක් සොයා කොළඹ යයි. ඔහු එහි දහදුක් විඳ, මහන්සියෙන් රැකියාවක් කර, ඒ මුදල් ඉතා පරෙස්සමෙන් ඉතුරුකර, ඒවා යොදා සුළු ව්‍යාපාරයක් අරඹා, වසර හත අටකට පසු මහා පොහොසතෙකු ලෙස, නවීන පන්නයේ මෝටර් රථයකින් ගමට සිය ගෙදරට එයි. ඒ එන විටත් අර බිරිඳට දරුවා ලැබී නැත. මෙය ලෝක පුදුමයක් නොවේද? එහෙත් ලංකාවේ ටෙලිනාට්‍ය නරඹන අයට ඒවා තේරෙන්නේ නැත. ඔවුන්ට ඕනෑ කාලය ගතවෙන්නට ටෙලිවිෂන් එක දිහා බලාගෙන ඉන්නටය. මෙම බුද්ධි මංකොල්ලය දැන් මහා ව්‍යාපාරයක් ලෙසින් ශ්‍රීලංකාවේ චැනල් ගණනකම ජයටම කෙරීගෙන යයි.

♦ **කීර්ති ද සේරම්**



ඉරිදා - SUN - ළඟදි රත්නපුරේ මහ ඇමතිකමට තරඟකරපු අපේ සිනමා නළු රන්ජන් රාමනායක ප්‍රසිද්ධියේ කියලා තිබුණා මේ යුද්දෙ නවත්වනව නම් එයා ප්‍රභාකරන්ගෙ දුව වුනත් බඳින්න ලෑස්තියි කියලා. ප්‍රභාකරන් ආසලු රැම්බෝ වගේ චිත්‍රපටි බලන්න. ඒ නිසා රන්ජන්වගේ බෑනා කෙනෙකුට කැමති වෙන්නත් පුළුවන්. මොකද රන්ජනුත් එක සැරේකට හතළිහක් එක්ක ගහගන්නවා වන්ෂොට් වල පෙන්නලා තියන නිසා. හැබැයි, ඒ කෙල්ල රන්ජන්ට වැඩිය හුඟක් බාලයි. ඒත් ඒක එච්චර දෙයක් නෙවෙයි, ඔය ඕන තරං වයසක මිනිස්සු තරුණ කෙල්ලො බඳින්නෙ. ප්‍රභාකරන්ට දෑවැද්ද හැටියට දුවට ගෙයක් නම් දෙන්න නෑ. ඒ වෙනුවට මං හිතන්නෙ කිලිනොච්චියෙන් බංකර් එකක් දේවි රන්ජන්ටයි දුවටයි.

සඳුදා - MON - යුද්ධෙකදි එක පැත්තකින් නොවෙයි දෙපැත්තෙන් ම මිනිස්සු මැරෙනවා. යුද්දෙ ස්වභාවය එහෙම තමයි. යුද්දෙ හොඳ නැහැයි කියන්නෙත් ඒ නිසාමයි. අපි නෙවෙයි යුද්ධ පටන්ගත්තෙ කොටි. මෙතන අපි කියලා කිව්වෙ කවුරු හෝ ශ්‍රීලංකාව පාලනය කරන රජයට. මේක 1975 දි විතර නියපොත්තෙන් කඩලා දාන්න තිබුණු දෙයක්. කවුරුවත් ගණන් ගත්තෙ නැහැ. අද පොරවෙන් කපලත් ඉවරකරගන්න බැරි තරම් බර-පතල වෙලා. ඇයි කොටින්ට ඔච්චර පුෂ්ටිමත් වෙන්න දුන්නෙ. දැන් ඒ ගැන කතාකරලා වැඩක් නෑ. දැන් මේක ඉවරකරලම දාන්න ඕන ඒක කරන්න පුළුවන්.

කුජදා - TUE - ළඟදිම ඇමරිකාවෙ ප්‍රාතිහාර්යයක් වේවි කියලා හිතෙනවා. ඔබාමා නමැති කල්ලා ඇමරිකාවෙ ජනාධිපති වෙන්නයි යන්නෙ. මාටින් ලූතර් කිංගෙ ලිපියක් මම හුඟක් ඉස්සර කියවලා තියනවා. ඒකෙ එයා කියනවා දැකපු හීනයක් ගැන. කලු ජාතිකයෙක් ඇමරිකා-වෙ ප්‍රසිඩන්ට් වෙලා ධවල මන්දිරයෙ ඒ පුටුවෙ වාඩි-වෙලා ඉන්නවා දවසක් හීනෙන් දැක්කලු. ඒ හීනෙ නේද මේ හැබෑ වෙන්න යන්නෙ? ලූතර් කිං අද හිටිය නම් මොන තරම් සංතෝෂ වේවිද? කලු ජතිකයො අප්‍රිකාවෙන් ඇමරිකාවට ගෙනව්වෙ වහල්ලු හැටියට. දැන් මේ ඒ වහලෙක් ජනාධිපති වෙන්නයි යන්නෙ. මට වල්පොලගෙ සිංදුවක් මතක්වෙනව. කැරකේවී රත රෝදේ වාගේ.

බුදදා - WED - අපේ සිංහලයො දුරදිග බලන්නෙ නැතුව මහා ගොං කතා කියනවා. ඒ ගොං කතා නිසා වෙන හානිය අපමණයි. අර තඹ සතේක වැඩක් නැති මැටි මෝල්, වාචාල, මර්වින් සිල්වට ආචාර්ය පට්ටමක් දුන්න මදිවට, ඒ යකා කොහේද මීටිමකදි එයා දුටුගැමුණු රජ්ජුරුවන්ගෙ නෑ කෙනෙක්ය කිව්වයි කියලා දැන් මර්වින්ට කවුරුත් කියන්නෙ දුටුගැමුණු කියලා. ඒක අපේ වීරෝදාර දුටුගැමුණු රජ්ජුරුවන්ට කරන අපහාසයක්. ඇයි අපේ ගොං සිංහලයට මේක තේරෙන්නෙ නැත්තෙ? දැන් ටැමිල් නෙට්, නිදර්සනම් වගේ කොටින්ගෙ වෙබ් අඩවිවල, උදයන් වගේ දෙමළ පත්තරවල දුටුගැමුණු රජ්ජුරුවන්ට බනින්නෙ මර්වින්ගෙ පිට දාලා. මර්වින් රූපවාහිනියෙදි ගුටිකාපු දවසෙ ඒවායෙ ගියේ දුටු ගැමුණුට එළව එළවා පහර දෙයි. දුටුගැමුණු රෙදිත් නැතුව දුවයි කියලා. මොළේ කළඳක් නැති ගොංබූරු සිංහලයා හැමදාම කළේ උඩ බලාගෙන කෙළ ගහන වැඩ.

ගුරුදා - THU - අපේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට අළුතින් එක් වුණු අජන්ත මෙන්ඩිස්ගෙ දක්ෂකම් ගැන මුරලි ගැන වගේම ක්‍රිකට් ලෝකෙ කවුරුත් කතාවෙනවා. අජන්ත නිසාමයි අපි ඒෂියා කප් එක මේ සැරේ දිනුවෙ. එදා අජන්තගෙන් ඉංග්‍රීසියෙන් අහපු ප්‍රශ්න වලට අජන්ත උත්තර දුන්නෙ සිංහලෙන්. "අජන්තට ඉංග්‍රීසි බැරි බව දැනිලා අපේ හදවත කඩාගෙන වැටුණ " යි කියල ලංකාවෙ සමහර සිංහලයො එහේ පත්තරවලට ලියලා තිබුණා. ඉංගිරිසියට තවම තියන දීන ගැතිකම ඒකෙන් පේනවා. මං හිතන්නෙ මුන් ගෙදර අයට කියලා තියාවි මැරුණ දාට පෙට්ටියට ඉංග්‍රීසි සිංහළ ඩික්ෂනරියකුත් දාල වහන්නය කියලා එහා ලෝකෙට යන ගමන් ඉංග්‍රීසි ටිකකුත් ඉගෙනගන යන්න.

කිවිදා - FRI - සුනාමියෙන් පස්සෙ හැංගිලා හිටපු ලංකාවෙ නක්-ශාස්ත්‍රකාරයො, හඳහන්කාරයො, පේන කියන කස්ටිය, ඔන්න ආයිත් එළියට බැහැලා අනාවැකි කියන්න පටන් අරන්. ඒ එක් කෙනෙක් ගිය සුමානෙ කියලා තිබුණා, එයාගෙ ජ්‍යොතිශ්‍ය ඇසට පේන විදියට, ප්‍රභාකරන්ට මාරකයක් තියනවය, දැන් යන්නෙ සෙනසුරාගෙ ඒරාශ්ඨකේය, එතෙන්දි කුජ නීචවෙලා, සඳු පැත්තකට වුනාම, බුදට වැහිලා රවිට හතරෙ කොටුව පේන්නෙ නැතුව යනවයි, ඒපාර කේතු මේෂෙට ආපු ගමන් මේ මාරකේ පල දෙනවයි කියලා. ඒ පාර කියනවා මරණෙ සිද්ධ වෙන්නෙ කැපෙන ආයුධයකින් නෙවෙයිය, නිකං ඩෝං ගාලා සද්දෙට ඇහෙන දේකින්ය, තුවක්කුවක් වගේ සැර ආයුදයක් ජ්‍යෝතිශ්‍ය ඇසට පේනවයි කියලා. තමිල් චෙල්වම් මැරෙන එකත් ඒගොල්ල හරියට කිව්වලු. හරි පුදුමයි. හැබැයි මොකද අච්චර සුනාමි විනාසයක් රටට වෙලා ඒක මේ හාදයින්ගෙ ඇසට එදා පෙනුණෙ නැත්තෙ? මං හිතන්නෙ ඒ වෙලාවෙ නින්ද ගිහිං තියෙන්න ඇති.

## කොළඹ විත්ති



# ශිෂ්‍ය පෙළපාලියට කඳුළුගෑස් ප්‍රහාරයක්



**ගි**ය අගෝස්තු මස **14** වෙනි දින සවස කොල්ලුපිටිය මංසන්ධිය යුද පිටියක් බවට හැරිණ. ජනාධිපතිවරයාට සංදේශයක් බාරදීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිට අරලියගහ මැඳුර දක්වා පැමිණි විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් හා පොලීසිය ගැටිණ. කොල්ලුපිටිය මංසන්ධියේ සිට ඉදිරියට අධි ආරක්ෂක කලාපයක් බැවින් එයට ඇතුල් නොවන ලෙස ශිෂ්‍යයින්ගෙන් ඉල්ලා සිටියත් ඔවුන් එය නොතකා මුරකපොලු ඉවත්කර බලෙන් ඉදිරි-යට යන්නට තැත්කළ අවස්ථාවේ ශිෂ්‍යයින් පළවාහැරීමට පොලීසිය කඳුළුගෑස් ගැසී ය.

මෙම පෙළපාලියේ මුවාවෙන් කොටි ත්‍රස්තවාදීන්ද අරලියගහ මැඳුරට ඇතුල්වීමට හොඳටම ඉඩ ඇති නිසා බාරදෙන සංදේශය රැගෙන ශිෂ්‍ය නායකයින් **5** දෙනෙකුට පමණක් එන ලෙස කීවත් ශිෂ්‍යයින් ඒ ඉල්ලීම නොතකා බලෙන් අධි ආරක්ෂක කලාපයට ඇතුල් වී තිබේ. සමහර ශිෂ්‍යයින් පොලීසියට ගල්මුල් වලින් පහර දුන් විට පොලීසිය පෙරලා ප්‍රහාර එල්ල කළේ ය.

ලේ පෙරාගත් ශිෂ්‍යයෙක් සහ කඳුළු ගෑස් වැදුණු හිමිනමක් පින්තූරවල දැක්වේ.